සැ. යු. — 2015.05.29 දින පළ වූ අංක 1,917 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,918 - 2015 ජුනි මස 05 වැනි සිකුරාදා - 2015.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 882 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 883 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 885 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජුනි මස 26 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## ගැසට් පත්‍රය සංශෝධනය කිරීම

### මීරිගම ප්‍රාදේශීය සභාව

2015.05.22 දිනැති අංක 1916 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටස පළාත් පාලනය තනතුරු ඇබෑර්තු යටතේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම - මීරිගම ප්‍රාදේශීය සභාව ශීර්ෂය යටතේ පල කරන ලද නිවේදනයේ පළ වූ විස්තර පහත පරිදි නිවැරදි විය යුතු අතර, ඒවා සංශෝධනය කර පළකරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

*01. පළ වූ ආකාරය*

| *අනු. අංකය* | *තනතුර* | *සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කර්මාන්ත පරිපාලක | 01 | රු.13,120-10x145-11x170-10x240-10x320 - රු. 22,040 04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ගණිතය/වාණිජ ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම ;<br>*හෝ*<br>(ආ) ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;<br>*හෝ*<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10ට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පංතිය සාමාර්ථය ලබා තිබීම; |

*සංශෝධනය විය යුතු ආකාරය*

| | | | | |
|---|---|---|---|---|
| 02 | ආදායම් පරීක්ෂක III වන ශ්‍රේණිය | 01 | රු.13,120-10x145-11x170-10x240-10x320-රු.22,040 04 වන පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;<br>*හා*<br>(ආ) ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගෙයන් අවම වශයෙන් එක් විෂයයක් (01) සාමාර්ථය ලබා තිබීම; |

*02. පළ වූ ආකාරය*

*සටහන අංක 01*

01. රියදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

    1. අවම වශයෙන් 8 ශ්‍රේණිය / 9 වසර සමත් වී තිබිය යුතු ය.

*සංශෝධනය විය යුතු ආකාරය*
*සටහන අංක 01*

01. රියදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

    1. අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06කින් සමත් වීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05ක් සමත් ව තිබිය යුතු ය.)

| *අනු. අංකය* | *තනතුර* | *සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|

*03 . පළ වූ ආකාරය*

| | | | | |
|---|---|---|---|---|
| 04 | ක්ෂේත්‍ර කම්කරු (කා.සේ.සේවයේ 111) | 05 | රු.11,730-10x120-10x130 – 10x145-12x160-රු.17,600 04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 ශ්‍රේණිය / 9 වසර සමත්ව තිබීම. |

*සංශෝධනය විය යුතු ආකාරය*

| | | | | |
|---|---|---|---|---|
| 04 | ක්ෂේත්‍ර කම්කරු (කා.සේ.සේවයේ 111)<br>මාර්ග කම්කරු - 02<br>පුස්තකාල කම්කරු - 02<br>ආයුර්වේද සහායක - 01 | 05 | රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 ශ්‍රේණිය / 9 වසර සමත්ව තිබීම. |

*04. පළ වූ ආකාරය*

අයදුම්පත් "ලේකම්, මීරිගම ප්‍රාදේශීය සභාව, මීරිගම" යන ලිපිනයට 2015.06.08 දිනට පෙර මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*සංශෝධනය විය යුතු ආකාරය*

අයදුම්පත් "ලේකම්, මීරිගම ප්‍රාදේශීය සභාව, මීරිගම" යන ලිපිනයට 2015.06.22 දිනට පෙර මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කේ. ජයතිලක,
ලේකම්,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2015ක් වූ මැයි මස 22 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-229

---

# පළාත් පාලන නිවේදන

## ගාල්ල මහ නගර සභාව

2015 වසර පරිපූරක අයවැය ලේඛනය

2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද පරිපූරක ආදායම් හා වියදම් ඇතුළත් වැඩසටහන් අයවැය ලේඛනය 2015.06.08 දින සිට දින 07ක කාලයක් ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා විවෘතව තබන බව මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 214 (2) 'ආ' වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. කැලුම් සෙනෙවිරත්න,
ගාල්ල නගරාධිපති (වැඩබලන).

2015 ජුනි මස 05 වැනි දින,
ගාල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

06-200

**සම්මත අතුරු ව්‍යවස්ථාවන් පිළිගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරන ලද නිවේදනය**

**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**

නිවාස දේපල සංවර්ධන හා ඉඩම් කට්ටි කිරීම සම්බන්ධව අතුරු ව්‍යවස්ථාව අංක 1317 හා 2003.11.28 දරන ගැසට් නිවේදනය

වයඹ පළාතේ නිවාස හා දේපල සංවර්ධන හා ඉඩම් කට්ටිකර විකිණීම සම්බන්ධව වන නව අතුරු ව්‍යවස්ථාව වයඹ ගරු ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් අනුමත කරනු ලැබූ 2003.11.28 දිනැති අංක 1317 දරන පළාත් සභා ගැසට් පත්‍රයේ ඇතුලත් අතුරු ව්‍යවස්ථාව 2014.03.25 දින පැවති මහා සභා රැස්වීමේදී අංක 05-09 දරන යෝජනාවෙන් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වන ඡේදය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර පිළිගන්නා බව මෙයින් නිවේදනය කරමි.

ලිවේරා ගුණතිලක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - පොල්ගහවෙල.

2014 අගෝස්තු මස 28 වැනි දින පොල්ගහවෙල,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-113

---

**රජ්ගම ප්‍රාදේශීය සභාව**

261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014.11.25 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 07.48 දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තොම්මාදුර නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 මැයි මස 06 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, දකුණු පළාතේ, පළාත් සභාව විසින් අනුමත කරන ලදුව, 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද සම්මත අතුරු ව්‍යවස්ථා/සම්මත අතුරු ව්‍යවස්ථාවල 1 සිට xxix දක්වා වූ කාණ්ඩ මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

06-40

---

**මොරටුව මහ නගර සභාව**

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානයේ මස් වෙළඳාම පවත්වාගෙන යාම පිණිස 2015 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර ඇත. ඒ අනුව විශේෂ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බල ඇති බවත් (272 වැනි අධිකාරිය) ගෝඝාතක ආඥා පනතේ 7 වැනි වගන්තය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එස්. එස්. අංගම්මන,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
මොරටුව.

2015 මැයි මස 19 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *වෙළඳ ව්‍යාපාරයේ නම* |
|---|---|---|---|
| ඒ. ඒ. මොහොමඩ් රිෂාඩ් අංක 66/32, සාවියා පාර, හේනමුල්ල, පානදුර | කටුබැද්ද නගර සභා මස් කඩය අංක 30, නගර සභා වෙළඳපල කටුබැද්ද. | ශීතකළ මස 'විකිණීම එළු මස්, කුකුල් මස්, හරක් මස් | කටුබැද්ද මීට් ෂොප් |
| එම්. ආර්. එම්. මිස්වර් අංක 22, කරුණාරත්න පාර, හේනමුල්ල, පානදුර | උස්වත්ත නගර සභා මස් කඩය | ශීත කළ මස් විකිණීම එළු මස්, කුකුල් මස්, හරක් මස් | එම්. ආර්. එම්. මීට් ෂොප් |
| බී, එම්. එම්. ඉෂාම් අංක 04, ගාලු පාර, ඉදිරිල්ලගොඩ, මග්ගොන | දිගරොල්ල දිනපොල නගර සභා මස් කඩය | ශීත කළ මස් විකිණීම එළු මස්, කුකුල් මස් හරක් මස් | එම්. අමාන් හරක් මස් වෙළඳ සැල |
| ඒ. ඒ. හයාතුල් බාවා අංක 117, උයන පාර, ලුනාව, මොරටුව | උයන නගර සභා මස් කඩය | ශීත කළ මස් විකිණීම එළු මස්, කුකුල් මස්, හරක් මස් | උයන මස් කඩය |
| එම්. එෆ්. එම්. රෂීඩ් අංක 26/5, ගාලු පාර, මොරටුව | මධ්‍යම වෙළඳපොල නගර සභා මස් කඩය, අංක 01 | ශීත කළ මස් විකිණීම එළු මස්, කුකුල් මස්, හරක් මස් | එම්. අමාන් මීට් ෂොප් |
| ටී. එන්. මධුසංඛ ප්‍රනාන්දු අංක 11, මොරටුමුල්ල දකුණ, මොරටුමුල්ල, මොරටුව. | අංක 23, මොරටුමුල්ල දකුණ, මොරටුමුල්ල, මොරටුව | ශීත කළ කුකුල් මස් විකිණීම | නිම්රාෂ් ෆාම් ෂොප් |
| පී. අනුරසිරි පෙරේරා 20ඒ/1, ශ්‍රී ජිනරතන මාවත අත්තිඩිය පාර, රත්මලාන | අංක 04, මහ නගර සභා වෙළඳපල, කටුබැද්ද, මොරටුව | ශීතකළ කුකුල් මස් සහ ශීත කළ ඌරු මස් විකිණීම | ඩී. එස්. ෆාම් ෂොප් |
| පී. එස්. ඉරුගල්බණ්ඩාර, අංක 374/14ඒ, ගාලු පාර රාවතාවත්ත, මොරටුව. | අංක 164/1ඩී, සොයිසාපුර, කටුබැද්ද | ශීතකළ මස් විකිණීම එළු මස්, කුකුල් මස්, හරක් මස්, ඌරු මස් | ස්ටාර් සිල්වර් ලයින් fපාම් ෂොප්. |

06-114

---

# විවිධ දැන්වීම්

### යටියන්තොට ප්‍රාදේශීය සභාව

යටියන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම

යටියන්තොට ප්‍රදේශීය සභාව විසින් 2015 වර්ෂයේ මාර්තු මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ, ඩී. වසන්ත කුමාර,
සභාපති,
යටියන්තොට ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 20 වැනි දින,
යටියන්තොට ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරය සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2012.07.13 වැනි දිනැති ගැසට් පත්‍රයෙහි ආදාහනාගාරයක් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි 17 වන පරිච්ඡේදයෙහි සඳහන් පරිදි ආදාහනාගාරයෙහි මෘත ශරීරයක් ආදාහනය කිරීම වෙනුවෙන් ගාස්තු අයකර ගත යුතුව ඇති අතර ඒ අනුව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි වෙසෙන පුරවැසියෙකු වෙතින් මෙම සේවා ලබා ගැනීම උදෙසා රුපියල් හයදාස් පන්සීයයක (රු. 6,500.00) ගාස්තුවක් අයකිරීමටත් බල ප්‍රදේශයෙන් පිටත වෙසෙන පුරවැසියෙකු වෙතින් මෙම සේවාව ලබා ගැනීම උදෙසා රුපියල් හත්දහස් පන්සීයක් (රු. 7,500.00) මුදලක් අය කිරීමටත් යටියන්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

06-162

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| ජුනි | 2015.06.05 | සිකුරාදා | 2015.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.12 | සිකුරාදා | 2015.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.19 | සිකුරාදා | 2015.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.26 | සිකුරාදා | 2015.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2015.08.07 | සිකුරාදා | 2015.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.14 | සිකුරාදා | 2015.07.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.08.21 | සිකුරාදා | 2015.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.28 | සිකුරාදා | 2015.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.